6 කාලය

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,
- කාලය මනින ඒකක ලෙස මාස, අවුරුදු, දශක, සියවස් සහ සහස්‍රක හඳුනා ගැනීමට,
- අධික අවුරුද්දක් යනු කුමක් දැයි හඳුනා ගැනීමට,
- කාලය මනින ඒකක අතර සම්බන්ධතා හඳුනා ගැනීමට සහ
- කාලය සම්බන්ධ මිනුම් එකතු කිරීමට හා අඩු කිරීමට

හැකියාව ලැබේ.

6.1 කාලය මනින ඒකක

තත්පර, මිනිත්තු, පැය සහ දින, කාලය මැනීමට යොදා ගන්නා ඒකක කිහිපයක් බව ඔබ මීට පෙර ඉගෙන ගෙන ඇත.

එක් දිනක් තුළ දී සිදු කරන විවිධ ක්‍රියාකාරකම් සඳහා ගත වන කාලය සොයා ගැනීමට වේලාව උපයෝගි කර ගන්නා ආකාරය ද ඔබ ඉගෙන ගෙන ඇත.

දැන් අපි තවදුරටත් කාලය මනින ඒකක ලෙස මාස, අවුරුදු, දශක, සියවස් සහ සහස්‍රක පිළිබඳ ව විමසා බලමු.

- **මාස සහ අවුරුදු**

යම් දිනයකින් පටන්ගෙන තවත් දිනක දී අවසන් වන සිදු වීමක් සඳහා ගත වන කාලය දවස් හෝ සති හෝ මාස හෝ කොපමණ ද යන්න කිසියම් දින දර්ශනයක් මගින් සොයාගත හැකි ය.

දින දර්ශනයක් දින, සති සහ මාස යන කාලය මනින ඒකක යොදා ගනිමින් සකසා ඇත. එහි මාස 12ක් ඇති බව ඔබට හඳුනාගත හැකි ය.

2015 වර්ෂයේ දින දර්ශනයට අනුව එක් එක් මාසයට තිබෙන දින ගණන වගුවේ දක්වා ඇත.

2015

January

S	M	T	W	T	F	S
				1	2	3
4	5	6	7	8	9	10
11	12	13	14	15	16	17
18	19	20	21	22	23	24
25	26	27	28	29	30	31

February

S	M	T	W	T	F	S
1	2	3	4	5	6	7
8	9	10	11	12	13	14
15	16	17	18	19	20	21
22	23	24	25	26	27	28

March

S	M	T	W	T	F	S
1	2	3	4	5	6	7
8	9	10	11	12	13	14
15	16	17	18	19	20	21
22	23	24	25	26	27	28
29	30	31				

April

S	M	T	W	T	F	S
			1	2	3	4
5	6	7	8	9	10	11
12	13	14	15	16	17	18
19	20	21	22	23	24	25
26	27	28	29	30		

May

S	M	T	W	T	F	S
31					1	2
3	4	5	6	7	8	9
10	11	12	13	14	15	16
17	18	19	20	21	22	23
24	25	26	27	28	29	30

June

S	M	T	W	T	F	S
	1	2	3	4	5	6
7	8	9	10	11	12	13
14	15	16	17	18	19	20
21	22	23	24	25	26	27
28	29	30				

July

S	M	T	W	T	F	S
			1	2	3	4
5	6	7	8	9	10	11
12	13	14	15	16	17	18
19	20	21	22	23	24	25
26	27	28	29	30	31	

August

S	M	T	W	T	F	S
30	31					1
2	3	4	5	6	7	8
9	10	11	12	13	14	15
16	17	18	19	20	21	22
23	24	25	26	27	28	29

September

S	M	T	W	T	F	S
		1	2	3	4	5
6	7	8	9	10	11	12
13	14	15	16	17	18	19
20	21	22	23	24	25	26
27	28	29	30			

October

S	M	T	W	T	F	S
				1	2	3
4	5	6	7	8	9	10
11	12	13	14	15	16	17
18	19	20	21	22	23	24
25	26	27	28	29	30	31

November

S	M	T	W	T	F	S
1	2	3	4	5	6	7
8	9	10	11	12	13	14
15	16	17	18	19	20	21
22	23	24	25	26	27	28
29	30					

December

S	M	T	W	T	F	S
		1	2	3	4	5
6	7	8	9	10	11	12
13	14	15	16	17	18	19
20	21	22	23	24	25	26
27	28	29	30	31		

දින 31කින් අවසන් වන මාස	දින 30කින් අවසන් වන මාස	දින 28කින් අවසන් වන මාස
ජනවාරි	අප්‍රේල්	පෙබරවාරි
මාර්තු	ජූනි	
මැයි	සැප්තැම්බර්	
ජූලි	නොවැම්බර්	
අගෝස්තු		
ඔක්තෝබර්		
දෙසැම්බර්		

ජනවාරි පළමු වැනිදායින් පටන් ගෙන දෙසැම්බර් තිස් එක් වැනිදායින් අවසන් වන අවුරුද්දක කාලයක් පිළිබඳ තොරතුරු කිසියම් වසරක් සඳහා වන දින දර්ශනයක සඳහන් ව ඇත.

මේ අනුව 2015 වර්ෂයේ දින දර්ශනයේ මුළු දින ගණන 365ක් වේ. දින දර්ශනයට අනුව අධික අවුරුද්දක් නොවන වසරකට දින 365ක් ඇත. අධික අවුරුද්ද පිළිබඳ ව පසු ව අධ්‍යයනය කරමු.

☞ 2015 - 08 - 01 දවස යනු,
2015 - 08 - 01 වේලාව 00:00 සිට 2015 - 08 - 01 වේලාව 24:00 දක්වා කාල පරිච්ඡේදය යි.

☞ එක් දිනයක් අවසාන වන මොහොතේ දී ම ඊළඟ දිනය පටන් ගනී. එම නිසා 2015 - 08 - 01, වේලාව 24:00 යනු 2015 - 08 - 02 වේලාව 00:00 දැක්වෙන වේලාවම වේ.

☞ 2015 වසර යනු,
2015 - 01 - 01 සිට 2015 - 12 - 31 තෙක් කාල පරිච්ඡේදය යි.

සටහන :
වර්ෂ වශයෙන් කාලය මැනීමට ඇතැම් ආගමික ශාස්තෘවරුන්ගේ උපත හෝ විපත සිදු වූ කාලවකවානුවක් පදනම් කරගනු ලැබේ. අන්තර්ජාතික සම්මුතිය වන්නේ කිතු උපත සිදු වී ඇති වර්ෂය යි. කිතු උපතට පසු ව යෙදන වර්ෂ ක්‍රිස්තු වර්ෂ (ක්‍රි.ව.) ලෙස ද කිතු උපතට පෙර වර්ෂ ක්‍රිස්තු පූර්ව (ක්‍රි.පූ.) ලෙස ද හැඳින්වේ.

- **දශක**

වසර 10ක කාල පරිච්ඡේදයක් දශකයක් ලෙස හඳුන්වනු ලැබේ. 1948 වර්ෂය සලකමු. එම වර්ෂය අයත් දශකයේ ප්‍රථම වසර වන්නේ 1941 වසර යි. එම දශකයේ අවසන් වසර වන්නේ 1950 වසර යි.

ක්‍රි.ව. 1 සිට - ක්‍රි.ව. 10 තෙක් පළමු දශකය වේ.
ක්‍රි.ව. 11 සිට - ක්‍රි.ව. 20 තෙක් දෙවන දශකය වේ.
ක්‍රි.ව. 1811 සිට - ක්‍රි.ව. 1820 තෙක් 182 වන දශකය වේ.
ක්‍රි.ව. 1951 සිට - ක්‍රි.ව. 1960 තෙක් 196 වන දශකය වේ.
ක්‍රි.ව. 2011 සිට - ක්‍රි.ව. 2020 තෙක් 202 වන දශකය වේ.

එනම්, 1941 - 01 - 01 දින වේලාව 00:00 සිට 1950 දෙසැම්බර් 31 වැනි දින වේලාව 24:00 දක්වා ඇති කාලය දශකයකි. මෙම දශකය 195 වන දශකය ලෙස ද හඳුන්වනු ලැබේ.

- **සියවස්**

අවුරුදු සියයක කාල පරිච්ඡේදයක් සියවසක් ලෙස හඳුන්වනු ලැබේ. එය ශතවර්ෂයක් ලෙස ද හැඳින්වේ.

ක්‍රි.ව. 1 සිට - ක්‍රි.ව. 100 තෙක් පළමු සියවස වේ.
ක්‍රි.ව. 101 සිට - ක්‍රි.ව. 200 තෙක් දෙවන සියවස වේ.
ක්‍රි.ව. 1801 සිට - ක්‍රි.ව. 1900 තෙක් 19 වන සියවස වේ.
ක්‍රි.ව. 1901 සිට - ක්‍රි.ව. 2000 තෙක් 20 වන සියවස වේ.
ක්‍රි.ව. 2001 සිට - ක්‍රි.ව. 2100 තෙක් 21 වන සියවස වේ.

ක්‍රි.ව 2001 - 01 - 01 දින වේලාව 00:00 සිට ක්‍රි.ව 2100 - 12 - 31 වැනි දින වේලාව 24:00 දක්වා ඇති කාලය 21 වන සියවස වේ.

- **සහස්‍රක**

වසර 1000ක කාල පරිච්ඡේදයක් සහස්‍රකයක් ලෙස හඳුන්වනු ලැබේ. මේ වන විට අපි ක්‍රි.ව. දින දර්ශනය අනුව දෙවන සහස්‍රකය පසු කර තුන්වන සහස්‍රකයේ ජීවත් වන අය වෙමු.

ක්‍රි.ව. 1 සිට ක්‍රි.ව. 1000 තෙක් පළමු සහස්‍රකය වේ.
ක්‍රි.ව. 1001 සිට ක්‍රි.ව. 2000 තෙක් දෙවන සහස්‍රකය වේ.

> **නිදසුන 1**
>
> (i) ක්‍රි.ව 1505 අයත් වන්නේ කී වන සහස්‍රයකට ද? දෙවන සහස්‍රකයට
> (ii) ක්‍රි.ව 1505 අයත් වන්නේ කී වන සියවසට ද? 16 වන සියවසට
> (iii) ක්‍රි.ව 1505 අයත් වන්නේ කී වන දශකයට ද? 151 වන දශකයට

6.1 අභ්‍යාසය

(1) පහත දැක්වෙන එක් එක් වර්ෂය අයත් වන්නේ කී වන දශකයට දැයි ලියා දක්වන්න.

(i) ක්‍රි.ව. 1856 (ii) ක්‍රි.ව. 1912 (iii) ක්‍රි.ව. 1978 (iv) ක්‍රි.ව. 2004

(2) 22 වන සියවසේ පළමු දිනය හා අවසාන දිනය ලියන්න.

(3) පහත දැක්වෙන එක් එක් වර්ෂය අයත් වන්නේ කී වන සියවසට දැයි ලියන්න.

(i) ක්‍රි.ව. 1796 (ii) ක්‍රි.ව. 1815 (iii) ක්‍රි.ව. 1956 (iv) ක්‍රි.ව. 2024

6.2 අධික අවුරුද්ද

2016 වර්ෂයේ දින දර්ශනයක් පහත දී ඇත. එක් එක් මාසයට අයත් දින ගණන සැලකුව හොත්, 2015 දින දර්ශනයෙන් මෙය වෙනස් වන්නේ කවරක් නිසා ද?

2016



දින 31කින් අවසන් වන මාස	දින 30කින් අවසන් වන මාස	දින 29කින් අවසන් වන මාස
ජනවාරි	අප්‍රේල්	පෙබරවාරි
මාර්තු	ජූනි	
මැයි	සැප්තැම්බර්	
ජූලි	නොවැම්බර්	
අගෝස්තු		
ඔක්තෝබර්		
දෙසැම්බර්		

පෙබරවාරි මාසයට දින 29ක් තිබීම හේතුවෙන් 2016 වර්ෂයට දින 366ක් ඇත. පෙබරවාරි මාසයට දින 29ක් ඇති සෑම අවුරුද්දක ම මුළු දින ගණන 366 වේ. එවැනි අවුරුද්දක් අධික අවුරුද්දක් ලෙස හඳුන්වනු ලැබේ.

යම් වර්ෂයක් දැක්වෙන සංඛ්‍යාව 100 ගුණාකාරයක් නොවේ නම්, එම සංඛ්‍යාව 4න් බෙදේ නම්, එය අධික අවුරුද්දකි.

100 ගුණාකාරයක් වන වර්ෂයක් අධික අවුරුද්දක් වන්නේ එය 400න් බෙදේ නම් පමණි.

නිදසුන 1

ක්‍රි.ව. 2000 අධික අවුරුද්දක් ද?

$2000 = 100 \times 20$ නිසා 2000, 100හි ගුණාකාරයකි.
$2000 \div 400 = 5$ නිසා 2000, 400න් බෙදේ.
$\therefore$ ක්‍රි.ව. 2000 අධික අවුරුද්දකි.

නිදසුන 2

ක්‍රි.ව. 1900 අධික අවුරුද්දක් ද?

1900, 100හි ගුණාකාරයකි.
1900, 400න් නොබෙදේ.
$\therefore$ ක්‍රි.ව. 1900 අධික අවුරුද්දක් නොවේ.

නිදසුන 3

ක්‍රි.ව. 2008 අධික අවුරුද්දක් ද?

2008, 100හි ගුණාකාරයක් නොවේ.
$2008 \div 4 = 502$ නිසා 2008, 4න් බෙදේ.
$\therefore$ ක්‍රි.ව. 2008 අධික අවුරුද්දකි.

නිදසුන 4

ක්‍රි.ව. 2010 අධික අවුරුද්දක් ද?
2010, 100හි ගුණාකාරයක් නොවේ.
භාජ්‍යතා රීති අනුව 2010හි අග ඉලක්කම් දෙකෙන් සෑදුණු සංඛ්‍යාව වන 10, 4න් නොබෙදේ.
$\therefore$ 2010, 4න් නොබෙදේ.
$\therefore$ ක්‍රි.ව. 2010 අධික අවුරුද්දක් නොවේ.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සටහන:
4හි ගුණාකාරයක් නොවන කිසිදු වර්ෂයක් අධික අවුරුද්දක් නොවේ.

• කාලය මනින ඒකක අතර සම්බන්ධතාව තවදුරටත්

තත්පර 60 = මිනිත්තු 1
මිනිත්තු 60 = පැය 1
පැය 24 = දින 1

දින 28, 29, 30, 31 බැගින් වූ මාස ඇත.
නමුත් දින 30ක් මාස 1ක කාල පරිච්ඡේදයක් ලෙස ගණනය කිරීම්වල දී සලකනු ලැබේ.

මාස 12 = අවුරුදු 1
දින 365 = අවුරුදු 1
දින 366 = අධික අවුරුදු 1

අවුරුදුවලින් දී ඇති කාලයක් දින ගණන්වලින් දැක්වීමේ දී අවුරුදු ලෙස දී ඇති ගණන 365න් ගුණ කළ යුතු ය.

අවුරුදුවලින් දී ඇති කාලයක් මාසවලින් දැක්වීමේ දී අවුරුදු ලෙස දී ඇති ගණන 12න් ගුණ කරනු ලැබේ.

සටහන:
දින 30ක් මාසයක් ලෙස සැලකුව ද, අවුරුද්දකට මාස 12ක් ඇති හෙයින් අවුරුද්දකට ඇති දින ගණන දින 30 ඒවා 12ක්, එනම් දින 360ක් යැයි වරදවා තේරුම් නොගත යුතු ය. මාසයකට දින 30ක් ලෙස සැලකුව ද අවුරුද්දකට දින 365ක් ලෙස ගණනය කිරීම්වල දී සලකනු ලැබේ.

නිදසුන 1

(i) දින 280, මාස සහ දිනවලින් දක්වන්න.

```
      9
30 | 280
   | 270
   |  10
```

දින 280ක් යනු මාස 9යි දින 10කි.

නිදසුන 2

(i) අවුරුදු 3 මාසවලින් දක්වන්න.
(ii) අවුරුදු 3 දිනවලින් දක්වන්න.

(i) අවුරුදු 3 = මාස 3 × 12
= මාස 36

(ii) අවුරුදු 3 = දින 3 × 365
= දින 1095

6.2 අභ්‍යාසය

(1) පහත දැක්වෙන වර්ෂ අතුරින් අධික අවුරුදු වන වර්ෂ තෝරා ලියන්න.

(i) ක්‍රි.ව. 1896 (ii) ක්‍රි.ව. 1958 (iii) ක්‍රි.ව. 1960

(iv) ක්‍රි.ව. 1400 (v) ක්‍රි.ව. 1600 (vi) ක්‍රි.ව. 2016

(2) (a) පහත දැක්වෙන එක් එක් දින ගණන, මාස සහ දිනවලින් දක්වන්න.

(i) දින 255 (ii) දින 100 (iii) දින 180

(b) අවුරුදු 5කට මාස කීය ද? දින කීය ද?

(3) බස් රථයක් දිනකට ගමන් වාර 4 බැගින් මාස 6ක් තුළ දිනපතා ම ධාවනයේ යෙදුණේ නම් එය ගමනේ යෙදුණු මුළු ගමන් වාර සංඛ්‍යාව කීය ද?

(4) දිනකට බෙහෙත් පෙති 3 බැගින් රෝගියකු මාස 2ක් තුළ දිනපතා බෙහෙතක් ගත යුතු ව ඇත. ඒ සඳහා අවශ්‍ය වන බෙහෙත් පෙති ගණන කීය ද?

(5) දිනපතා අනිවාර්යයෙන් ම පැය 1ක් ව්‍යායාමවල යෙදෙන අයකු

(i) වර්ෂයක දී ඔහු ව්‍යායාම කළ (අවම) පැය ගණන සොයන්න (අධික අවුරුද්දක් නොවන වර්ෂයකි).

(ii) එම කාලය දිනවලින් දක්වන්න.

(6) දිනකට අවම වශයෙන් රුපියල් 5 බැගින් අනිවාර්යයෙන් ම කැටයක දමන අයකුට පහත දැක්වෙන එක් එක් කාලය තුළ එකතු කළ හැකි අවම මුදල සොයන්න.

(i) මාස 6ක දී (ii) අධික අවුරුද්දක දී

6.3 කාලය ආශ්‍රිත ගණනය කිරීම්

පාසලක පළමු වාරය තුළ මාස 3යි දින 6ක් ද දෙවන වාරය තුළ මාස 3යි දින 8ක් ද තෙවන වාරය තුළ මාස 3යි දින 3ක් ද පාසල පවත්වා ඇත. එම වර්ෂයේ දී පාසල පැවැත්වූ මුළු කාලය මාස හා දිනවලින් ප්‍රකාශ කරමු.

මාස	දින
3	6
3	8
+ 3	3
9	17

මේ සඳහා ඉහත කාල, එකතු කළ යුතු වේ.

එවිට පාසල පැවැත්වූ මුළු කාලය මාස 9යි දින 17කි.

නිදසුන 1

ගුරුවරයකු වසර 5යි මාස 6යි දින 23ක් නැගෙනහිර පළාතේ පිහිටි පාසලක ද අවුරුදු 6යි මාස 8යි දින 15ක් මධ්‍යම පළාතේ පිහිටි පාසලක ද ඉතිරිය දකුණු පළාතේ පිහිටි පාසලක ද සේවය කර විශ්‍රාම ලැබුවේ ය.

(i) ඔහුගේ නැගෙනහිර හා මධ්‍යම පළාත්වල මුළු සේවා කාලවල එකතුව සොයන්න.

(ii) ඔහුගේ මුළු සේවා කාලය අවුරුදු 28යි මාස 2යි දින 2කි. ඔහු දකුණු පළාතේ පිහිටි පාසලේ සේවය කළ කාලය සොයන්න.

(i)

අවුරුදු	මාස	දින
5	6	23
+ 6	8	15
		8

දින තීරයේ දින ගණන් එකතු කරමු.
දින 23 + දින 15 = දින 38
දින 38 = මාස 1 + දින 8
දින 8, දින තීරයේ ලියා මාස 1, මාස තීරයට ගෙනගොස් එකතු කරමු.

අවුරුදු	මාස	දින
5	6	23
+ 6	8	15
12	3	8

මාස 1 + මාස 6 + මාස 8 = මාස 15 = අවුරුදු 1 මාස 3
මාස 3, මාස තීරයේ ලියමු.
අවුරුදු 1 අවුරුදු තීරයට ගෙන ගොස් එකතු කරමු.

අවුරුදු 1 + අවුරුදු 5 + අවුරුදු 6 = අවුරුදු 12

ගුරුවරයාගේ නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල මුළු සේවා කාලය අවුරුදු 12යි මාස 3යි දින 8කි.

(ii) අවුරුදු මාස දින

අවුරුදු	මාස	දින
28	2	2
– 12	3	8
		24

දින තීරයේ දින ගණන් අඩු කරමු.
2 < 8 බැවින්, මාස තීරයෙන් මාස 1ක්, එනම් දින 30ක් දින තීරයට ගෙන යමු.
එවිට දින 30 + දින 2 = දින 32
දින 32 – දින 8 = දින 24
දින 24, දින තීරයේ ලියමු.

අවුරුදු	මාස	දින
28	2	2
– 12	3	8
15	10	24

මාස තීරයේ ඉතිරි මාස 1න් මාස 3ක් අඩු කළ නොහැකි ය. ඒ නිසා අවුරුදු තීරයෙන් අවුරුදු 1ක් එනම් මාස 12ක් මාස තීරයට රැගෙන යමු.
එවිට මාස 12 + මාස 1 = මාස 13
මාස 13 – මාස 3 = මාස 10
මාස 10 මාස තීරයේ ලියමු.

අවුරුදු තීරයේ ඉතිරි අවුරුදු 27න් 12ක් අඩු කළ විට, අවුරුදු 15කි.

ගුරුවරයාගේ දකුණු පලාතේ පාසලේ සේවය කළ කාලය අවුරුදු 15යි මාස 10යි දින 24කි.

නිදසුන 2

දිනූෂා ගේ උපන්දිනය 2008 - 05 - 06 වේ.
(i) 2016 - 08 - 24 දිනට ඇයගේ වයස අවුරුදු මාස සහ දිනවලින් සොයන්න.
(ii) නිමල් ඇයට වඩා අවුරුදු 3යි මාස 6යි දින 3ක් බාල ය. නිමල්ගේ උපන්දිනය සොයන්න.

(i) වයස සෙවීමට නියමිත දිනය = 2016 - 08 - 24
දිනූෂා ගේ උපන්දිනය = 2008 - 05 - 06
2016 - 08 - 24 දිනට දිනූෂා ගේ වයස සොයමු.
දිනූෂා ගේ වයස අවුරුදු 8යි මාස 3යි දින 18කි.

අවුරුදු	මාස	දින
2016	8	24
–2008	5	6
8	3	18

(ii) නිමල්ගේ උපන්දිනය 2011 නොවැම්බර් මස 09 වන දා වේ.

අවුරුදු	මාස	දින
2008	5	6
+ 3	6	3
2011	11	9

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

6.3 අභ්‍යාසය

(1) එකතු කරන්න.

(i)

මාස	දින
8	18
+2	11

(ii)

මාස	දින
8	22
+2	16

(iii)

අවුරුදු	මාස	දින
12	6	21
+3	2	19

(iv)

අවුරුදු	මාස	දින
8	9	19
+2	6	23

(2) අඩු කරන්න.

(i)

මාස	දින
6	23
−3	15

(ii)

මාස	දින
6	18
−2	24

(iii)

අවුරුදු	මාස	දින
3	6	15
−2	4	18

(iv)

අවුරුදු	මාස	දින
2	8	12
−1	2	15

(3) දිලීපගේ උපන් දිනය 2003 - 09 - 07
සිතුමිණිගේ උපන් දිනය 2000 - 02 - 04

(i) සිතුමිණි දිලීපට වඩා කොපමණ වයසින් වැඩි දැයි, උපන්දින ඇසුරෙන්, සොයන්න.

(ii) 2018 - 03 - 31 දිනට දිලීපගේ වයසත් සිතුමිණිගේ වයසත් අවුරුදු, මාස සහ දිනවලින් සොයන්න.

(iii) සිතුමිණි දිලීපට වඩා කොපමණ වයසින් වැඩි දැයි, දෙදෙනාගේ වයස් ඇසුරෙන්, සොයන්න.

(4) පහත දැක්වෙන්නේ ගුරුවරුන් දෙදෙනකු පාසලක සේවය කළ සේවා කාලයන් වේ.

	සේවයට පැමිණි දිනය	**පාසලින් අස් වූ දිනය**
විතානගේ මහතා	2001 - 07 - 13	2015 - 11 - 22
රෝහන මහතා	1997 - 03 - 20	2012 - 01 - 10

(i) එක් එක් ගුරුවරයා එම පාසලේ සේවය කළ කාලය සොයා ඒ ඇසුරෙන් වැඩි කාලයක් එම පාසලේ සේවය කළේ කවුරුන් දැයි පෙන්වා දෙන්න.

(ii) වැඩි සේවා කාලයක් ඇති ගුරුවරයාගේ සේවා කාලය, අනෙක් ගුරුවරයාගේ සේවා කාලයට වඩා කොපමණ ප්‍රමාණයක් වැඩිවේ ද?

(5) ශෂිකාගේ උපන් දිනය 2004 - 08 - 13 වේ. අහේලි ඇයට වඩා අවුරුදු 1යි මාස 8යි දින 25ක් වැඩිමල්ය. අහේලිගේ උපන් දිනය කවරදා ද?

(6) පාසලක් මුල්වරට ආරම්භ කළ දිනය 1928 - 03 - 26 වේ.
 (i) එම පාසලට සියවසක් සම්පූර්ණ වන දිනය කවරදා ද?
 (ii) ඒ දිනය සඳහා අද සිට තව දින කීයක් තිබේදැයි සොයන්න.

(7) අමිල 2012 - 02 - 13 දින සිට 2014 - 07 - 27 දින දක්වා ජපානයේත් 2014 - 12 - 17 දින සිට 2015 - 10 - 05 දින දක්වා චීනයේත් කෘෂිකර්මය පිළිබඳ ව පුහුණුවීම්වල යෙදී සිටියේ ය. ඔහු ජපානයේ හා චීනයේ පුහුණුවීමවල යෙදී සිටි මුළු කාලය සොයන්න.

මිශ්‍ර අභ්‍යාසය

(1) අවුරුදු 10ක් තුළ දී සෑම මසකට වරක් ම සමාන වාරිකයකින් ගෙවීමේ පොරොන්දුව පිට ණය මුදලක් ගත් අයකු පළමු වාර මුදල 2016 - 01 - 01 දින සිදු කළේ නම් අවසාන වාරිකය ගෙවිය යුතු දිනය සොයන්න.

(2) පාසලක නිවාසාන්තර ක්‍රීඩා තරග සඳහා තෝරා ගන්නා වයස් පිළිබඳ නිර්ණායකය පහත දැක්වේ.
11න් පහළ තරග, 2016 - 03 - 31 දිනට වයස අවුරුදු 11ට අඩු විය යුතු ය.
13න් පහළ තරග, 2016 - 03 - 31 දිනට වයස අවුරුදු 13ට අඩු විය යුතු අතර අවුරුදු 11 හෝ අවුරුදු 11ට වැඩි විය යුතු ය.

15න් පහළ තරග, 2016 - 03 - 31 දිනට වයස අවරුදු 15ට අඩු විය යුතු අතර අවරුදු 13 හෝ අවරුදු 13ට වැඩි විය යුතු ය.

17න් පහළ තරග 2016 - 03 - 31 දිනට වයස අවරුදු 17ට අඩු විය යුතු අතර 15 හෝ අවරුදු 15ට වැඩි විය යුතු ය.
සිසුන් කීපදෙනකුගේ උපන්දින පහත දැක්වේ.

නම	උපන්දිනය
චන්දුල	2005 - 12 - 08
හෂාන්	2002 - 05 - 17
හසින්ත	2000 - 01 - 16

එක් එක් සිසුවා සුදුසුකම් ලබන්නේ කවර වයස් සීමාවේ තරග සඳහා දැයි සොයා දක්වන්න.

අමතර දැනුමට

● අධික අවුරුද්ද ඇති වීම



අධික අවුරුද්දක් නොවන අවුරුද්දකට - එනම්, ලිත් වර්ෂයකට - දින 365ක් ඇතුළත් යයි අප සැලකුව ද පෘථිවිය සූර්යයා වටා එක් වටයක් ගමන් කිරීමට ගත වන සැබෑ කාලය ආසන්න වශයෙන් දින 365යි පැය 5යි මිනිත්තු 48යි තත්පර 46කි. මෙම කාලය සූර්ය වර්ෂයක් ලෙස හැඳින්වේ. මෙය ආසන්න වශයෙන් දින 365 $\frac{97}{400}$කි. එහෙත් වර්ෂයක් සඳහා මෙම පැය 5යි මිනිත්තු 48යි තත්පර 46ක කාලය නොසලකා හැර ඇත.

එසේ එක් වර්ෂයකට නොසලකා හරින ලද පැය 5යි මිනිත්තු 48යි තත්පර 46 බැගින් වූ කොටස් 4ක් එකතු වූ විට එය දිනකට ආසන්න වේ.

එම දිනය වසර 4කට වරක් වැඩිපුර දිනයක් ලෙස එකතු කෙරේ. මෙම අතිරේක දිනය එකතු වන්නේ පෙබරවාරි මාසයට යි. ඒ අනුව පෙබරවාරි මාසයට දින 29ක් සහිත අධික අවුරුද්ද ඇති වේ.

වසර හතරකට වරක් වැඩිපුර දිනයක් එකතු කළ ද සැබෑ ලෙසම එකතු කළ යුත්තේ ආසන්න වශයෙන් පැය 23යි මිනිත්තු 15යි තත්පර 4ක කාලයකි. එම නිසා, අධික අවුරුද්දක් තීරණ කිරීමේ දී අවුරුදු හතරකට වරක් වැඩිපුර දිනය යොදා ගැනීම නිසා වසර 400කට වරක් ආසන්න වශයෙන් දින 3ක් වැඩිපුර ගණනය වේ.

එබැවින් වසර 400ක් තුළ දී දින 3ක් ඉවත් කළ යුතු ය.

ඒ සඳහා මුල් 100 ගුණාකාර තුනේ දී දිනය බැගින් ඉවත් කෙරේ. එනම්, පෙබරවාරි මාසයට වැඩිපුර දිනයක් එකතු නොකෙරේ.

ඒ අනුව 100 ගුණාකාරයක් වන වර්ෂයක් අධික අවුරුද්දක් වන්නේ එය 400හි ගුණාකාරයක් නම් පමණි.

සාරාංශය

- වසර 10ක කාල පරිච්ඡේදයක් දශකයක් ලෙස හඳුන්වනු ලැබේ.
- අවුරුදු 100ක කාල පරිච්ඡේදයක් සියවසක් ලෙස හඳුන්වනු ලැබේ.
- වසර 1000ක කාල පරිච්ඡේදයක් සහස්‍රකයක් ලෙස හඳුන්වනු ලැබේ.
- යම් වර්ෂයක් දැක්වෙන සංඛ්‍යාව 100 ගුණාකාරයක් නොවේ නම්, එම සංඛ්‍යාව 4න් බෙදේ නම් එය අධික අවුරුද්දකි. එහෙත් 100 ගුණාකාරයක් වන වර්ෂ අධික අවුරුද්දක් වන්නේ එය 400න් බෙදේ නම් පමණි.
- කාලය සම්බන්ධ ගණනය කිරීම්වල දී මාසයක් යනු දින 30ක් ද අවුරුද්දක් යනු මාස 12ක් ද අවුරුද්දක් යනු දින 365ක් ද ලෙස සලකනු ලැබේ.

සිතන්න

(1) 2002 - 09 - 23 දින පෙ.ව. 9.32ට උපත ලැබුවකු 2015 - 06 - 05 දින මධ්‍යාහ්න 12 තෙක් ජීවත් වී ඇති කාලය නිවැරදිව අවුරුදු, දින, පැය සහ මිනිත්තුවලින් සොයන්න.

(2) උපතේ සිට දින 20591ක් ජීවත් වූ අයකු මිය යන විට ඔහුගේ වයස අවුරුදු, මාස සහ දිනවලින් සොයන්න.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.